# සුනිල් සාන්ත ගේ ජීවිත සටහන

1915 අප්‍රියල් මස 14 දින බද්දලියනගේ දොන් ජෝසප් ජෝන් ළදරුවා උපත ලැබුවේය. දෙමවුපියන් මියගිය පසු ළදරු දොන් ජෝසප් හදාගනු ලැබුවේ ආච්චි සහ මාමලා පස් දෙනාය. ඔහු මූලික අධ්‍යාපනය ලැබුවේ දෙහියගාත පාසලේ දීය. මාමා කෙනෙකු වන එම්. ජේ. පෙරේරා වාදකයෙක් විය. ජෝසප් ජෝන් ළමා කාලයේදීම ඒ වාදනය උගත්තේ නමුත් ලොකු මාමා ඔහු සංගීතය ඉගෙනීම අනුමත නොකලේය. ඉක්බිතිව තුඩැල්ලේ සිංහල පාසලේ දෙවැන්නේ සිට පස්වැන්න තෙක් සිප් හැදෑරීය. යලිත් දෙහියගාත පාසලට පැමින එහි නාට්‍ය සංගීත විෂයෙහි දස්කම් දක්වන්නෙකු විය. දුටුගැමුණු රජුගේ චරිතය රඟපා ඔහු ජනප්‍රිය විය. ඔහු දක්‍ෂ වියෝල වාදකයෙක් විය.

1931 දී පාසලින් පාඨශාලා හැර යෑමේ පරීක්‍ෂණයට ඉදිරිපත් වූ ඔහු දිවයිනේම ප්‍රථම ස්ථානය දිනා "වීරරත්න ත්‍යාගය" හිමි කරගනී.
1932 දී ගම්පහ බෞද්ධ පාඨශාලාවේ ශිෂ්‍යයෙක් වශයෙන් ගුරු ප්‍රාරම්භ පරීක්‍ෂණයට ඉදිරිපත්ව එයින් සාමාර්ථය ලබාගැනීම.

1936 දී පුහුණුවෙන් පසු ගාල්ලේ කල්වාරිකන්ද පාසලේ ගුරු තනතුරකට රාජකීය චිත්‍ර සංගමයෙන් සහතික දිනාගැනීම තවද මහා බ්‍රිතාන්‍යයේ ජාතික මහා ගුරු සංගමයානුබද්ධ සමස්ත ලංකා එක්සත් ස්වභාෂා ගුරු සංගමය මගින් පවත්වන ලද අධ්‍යාපන ප්‍රදර්ශනයේදී ගුරු භවතුන්ගේ හස්ත කර්මාන්ත නිෂ්පාදන පිළිබඳ දෙවැනි ස්ථානය ද විසිතුරු භාණ්ඩ නිෂ්පාදනය පිළිබඳ පළමු ස්ථානය ද දිනා ජෝසප් ජෝන් පදක්කම් හිමි කර ගනී.

1936 -1939 කාලයේ දී ජෝසප් ජෝන් ගේ ශිෂ්‍යයෝ නොකඩවා තෙවසරක් ම දක්ෂින ලංකා පාඨශාලා සංගීත තරඟයෙන් පළමු තැන දිනා ගැනීමෙන් ඒ කුසලාන ස්ථිරව කල්වාරිකන්ද පාසලට හිමිවීමයි. ඒ හැරුනුවිට ඌරාපොල බණ්ඩා ගුරුන්නාන්සේගෙන් ජනකවි සහ වන්නම් ගායනය ඉගෙන ගැනීම.

1939 දී ඉන්දියාවේ ශාන්ති නිකේතනයේ ශිෂ්‍යයකු වශයෙන් ශාස්ත්‍රීය සහ වංග සංගීත ගායනා සහ වාදන ශිල්ප හදාරන්නට වීම. 1940 දී මාරිස් හින්දුස්ථානී සංගීත විද්‍යා පීඨය ලක්නව් හෙවත් භාත්ඛණ්ඩේ සංගීත විශ්ව විද්‍යාලයේ ශිෂ්‍යයකු වශයෙන් අධ්‍යයන කටයුතු ආරම්භ කිරීම.

1944 දෙසැම්බර් මාසයේදී භාත්ඛණ්ඩේ ආයතනයේ සිවු වසරක් ශාස්ත්‍රීය සංගීතය හදාරා සිතාර් වාදනය පිළිබඳ වාද්‍ය විශාරද උපාධිය දිනා ගැනීම. ඒ පරීක්‍ෂණයෙන් ඔහු සමත් වූයේ පෙරදිග රටවලින් පැමිණි සියලුම ශිෂ්‍යන් අතරින් ප්‍රථම පන්තියේ පළමු වැනියා වශයෙනි. 1943 වසරේ දී ගායනය පිළිබඳ මධ්‍ය ඩිප්ලෝමා පරීක්‍ෂණයෙන් පළමුවන පන්තිය සමත් ඔහු මේ දෙ අංශයෙන්ම සුදුසු කම් ලත් ප්‍රථම ලාංකිකයාය.

දෙසම්බර් 24 මාසයේ දී 'සුනිල් සාන්ත' වශයෙන් මව් බිමට ආපසු පැමිණීම.

1945 දී අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ සංගීත පරීක්‍ෂක පදවියට අයකු පත් කර ගත් නිසා කළ හැකි දෙයක් නැතැයි යන බලාපොරොත්තු රහිත පිළිතුර ලැබීම තව දුරටත් කපුකොටුව මහතා සිංහල ගුරු සහතිකයට පමණක් හිමි හිගන වැටුපක් සහිතව තනතුරක් ඔහුට පැවරූ නමුත් එය නොපිලිගැනීම.

භාත්ඛණ්ඩෙ උපාධි උත්සවයේ දී 'සංගීත් විශාරද' සන්නස් පත්‍රය ලැබීම. ඒ සමයේ කුලපති තනතුර හෙබවූයේ රාම්පූර්හි නාවාබ් සහීබ් බහාදූර් උතුමානන් ය. සුනිල් සාන්ත 'සිළුමිණ' පත්‍රයට සංගීතයේ මොන්ටිසෝරි ක්‍රමය යන ලිපිය ලවීම.

ජූලි මාසයේදී ජා-ඇල මිණුවන්ගොඩ පාරේ රේල් ගේට්ටුව අසල සංගීත පන්ති ආරම්භ කිරීම.

1946 දී බම්බලපිටිය ජයපාරේ විසූ සූයර්ශංකර් මොල්ලිගොඩ ප්‍රවීණ සංගිතඥයා ගේ නිවසෙහි රැඳී සිටිමින් දේශීය සංගීතය සොයා ගමන ආරම්භ කිරීම. පළමු වරට 1946 මාර්තු 02 වැනිදා කුමාරතුංග සමරු රැස්වීමේදී සමරු ගී ගැයීම නොබෝදිනකින් ඕලු පිපීලා තැටි ගත කිරීම මෙය ලංකා ගුවන් විදුලියේ තැටියකට නගන ලද මුල්ම ගීයයි. රිදී වලාව පොත පලකිරීම.

ඔක්තෝම්බර් මාසයේදී ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයේ පෙරදිග කලා සඳහා වෙන්වූ මේලා සංගමයේ වාර්ෂික ගැයුම් සහ නැටුම් සංදර්ශනට සහභාගී වීම. කොළඹ මල්ලිකා මහලු නිවාසට ආධාර පිනිස පුරහලේ පැවැත්වුනු විවිධ ප්‍රසංගයට සහභාගීවීම. බොරැල්ල තරුණ බෞද්ධ සමිති ශාලාවේදී පැවැති ගායන හා වාදන පන්ති ආරම්භ කිරීම.

1948 මැයි වලදී කොළඹ තරුණ බෞද්ධ සමිතියේ ආචාර්‍ය මලලසේකර මහතාගේ ප්‍රධානත්වයෙන් පැවති වෙසක් උත්සවයේ බැති ගී ගැයීම. සුනිල් සාන්ත සෝන්ග් ෆෝලියෝ පොත පල කිරීම. අරිසෙන් අහුබුදු විසින් පැබැදුනු වෙද විදුහල් ගීය පළමු වරට ගායනා කිරීම.

1950 මැයි 27 දා ජ්‍යොෂ්ඨ පාඨශාලා පරීක්ෂණයට අදාල පෙරදිග සංගීත පන්තියක් ජාඇලද කටහඬ පුහුණු කිරීමේ පන්තියක් කොල්ලුපිටියේද සුනිල් ආරම්භ කිරීම. 1950 අගෝස්තු මාසයේදී පෙරමුණ මගින් සංවිධානය කරන ලද විමසීමක් අනුව සුනිල් උසස්තම ගුවන් විදුලි ගායකයා බවට පත්වීම.

1952 දී ගුවන් විදුලි ආයතනයේ උපදෙස් පරිදි රතන්ජංකර් පඬිතුමන් විසින් පවත් වනු ලබන ශ්‍රේණිගතකිරීමේ පරීක්ෂණයට සුනිල් ඉදිරිපත් නොවීමෙන් ඔහු ගුවන් විදුලියෙන් ඉවත් කිරීමට තීරණය කිරීම.
රතන්ජන්කර් පරීක්ෂණය වර්ජනය කලේ සුනිල් සාන්ත මහතා පමණකි.

''මල් මිහිර'' පොත පළ වීම. එහි පිරිනැමීම මෙසේය. උගුරින් වැඩක් ගන්නට බැරි තරම් බීරම් අවධියක උන් මා සැත්කමින් යළි සගයු ලොවට පත් කල දකුතුරු පී. ආර්. ඇන්තනිස් නමට හරසරින් පිරි නැමෙයි."

අප්‍රේල් 26 දින ලංකාදීප පුවත්පත රතන්ජංකර් පරීක්ෂණය පිළිබඳ කතුවැකියක් පළකිරීම එහි ප්‍රධාන වැකි මෙසේය.

1. සිංහල සංගීතඥයන් වර්ග කිරීම සඳහා එතුමා සතු විශේෂත්වය කිම?

2. එතුමාගේම සිංහල ගොලයන් යලිත් පරීක්ෂණයට පත් කල යුතුද ?

3. අවශ්‍ය පැවැත්තේ ශිල්පීන් වර්ග කිරීමද ? ඒ කලාවේ පුන්ජීවය සඳහා මග සෙවීමද?

1952 දී ලීලා ජයසේකර මෙනවිය හා සුනිලුන් විවාහ වීම. ඒ උළෙලට සහභාගිවූයේ සාක්කිකරුවන් වශයෙන් අත්සන් කළ සංගීතඥ පර්සි විජේවර්ධන සහ වික්ටර් ප්‍රනාන්දු පමණි.

1953 ජුනි 26 මරදානේ නිව්ටන් ගොඩනැගිල්ලේ දේශීය සංගීතායතයක් සුනිල් අරඹන බවත් එහි සිසුසිසුවියන් දහදෙනෙකුට නොමිලයේ උගන්වන බවත් ලංකාදීපයේ පළ වීම. ඔක්තෝබර් මාසයේදී සංගීත ශිල්පය වැඩිදුර හැදෑරීම සඳහා ඇල්බට් පෙරේරා (අමරදේව) වෙත පහසුකම් සැලසීමේ ව්‍යාපාරයට සුනිල් අතදෙන්නට වීම.

මෙයට ඉහතදී ඇල්බට් පෙරේරා හට උපකාරයක් වශයෙන් සුනිල් ගේ පානදුර ඇති පන්ති ඇල්බට් පෙරේරා හට කරගෙන යාම සඳහා සුනිල් බාරදී තිබුණි

1956 සිට 1959 දක්වා කාලයේදී ලෙස්ටර් ජේම්ස් පීරිස්ගේ 'රේඛාව' හා 'සංදේශය' යන චිත්‍රපට වලට සුනිල් ගීතනු නිර්මාණය කිරීමයි. මේ අවධියේදී ඔහු දෙහියගාත ගම්මානයේ ගම් වැසියන්ගේ නිවෙස් වල සේයා රූ ගත කර ඉතා සුළු මුදලකට පිංතුර ලබා දුන්නේය.

1967 දී ගුවන් ආයතන අධ්‍යක්‍ෂ නෙවිල් ජයවීර මහතා සුනිල්ට වැඩ සටහන් කිරීමට ආරාධනා කිරීම. මධුර මධු වැඩසටහන මගින් ඒක-ස්වර ගී, චතුස්වර ගී ආදී නව නිර්මාණ ප්‍රබන්ධ කිරීම. ගුවන් විදුලි ශිල්පීන් වර්ගී කිරීම සඳහා පත්කරන ලද මන්ඩලයේ ප්‍රධානියා ලෙස කටයුතු කිරීම ලෙස ඔහුට සහයක එච්. ඩබ්ලිව්. රූපසිංහ සහ ඩබ්ලිව්. ඩී. අමරදේව ඔහුට සහය වූහ.

ඔහු සිටි කුලී නිවස අතහැර යාමට සිදුවූ විට නැන්දනිය වූ ඇග්නස් පෙරේරා මැතිනිය මේ පවුලට තම නිවස යාබද කොටස හා හිස්ව තිබූ කුකුළු කොටුවේ නවාතැන් දුනි.
1977 මාර්තු 'සුන්දර හිමිදිරියේ' 'සුමනෝ' 'හැවිල්ල' හෝ ගා රැල්ල බිදේ' 'ලලිත ලවංග කුරුලු ආදරේ' රාම වැලපිල්ල' 'සාලිය ආලය' 'ලංකා ලංකා' 'වෙරළේ මිහිර' යන ගී දහය ඇතුළත් සුනිල් ගී තැටිය නිකුත් වීම.

1980 දී රණසිංහ ප්‍රේමදාස අග්‍රාමාත්‍ය තුමන් සුනිලුනට නොමිලයේ නිවසක් ප්‍රදානය කිරීම නිවසේ අයිතිය ප්‍රතික්ෂප කළ සුනිල් නිවාස දෙපාර්තමේනතුවට මාසික කුලියක් ගෙවන අන්දමට එය පිළිගනී.

ප්‍රචාරය වූ ගී සඳහා ගුවන් විදුලි සංස්ථාව මේ අවදිය වනවිට කලා කරුවනට සුළු මුදලක් ගෙවූ නමුත් සුනිල් ඒ මුදල් ගත්තේ නැත.

1981 පෙබරවාරී 28 දින සුනිල් සාන්ත ගේ බාල පුත්‍ර තෙව්සි හැවිරිදි (වානේ සංස්ථාවේ ඉංජිනේරු) ජගත් සාන්ත එම සංස්ථාවේ උත්සවයකදී මිය යාම. මාර්තු දෙ වැනි දා ඒ පිළිබඳ අවමගුල සිදු කැරිණි.

1981 අප්‍රේල් 11 වැනි දා පෙරවරුවේදී සුනිල් අභාවයට පත් වීම. ඔහු ගේ නෙත් ශ්‍රී ලංකා අක්ෂිදාන සංගමය පිළිගති. ජා-ඇල දෙහියගාත මුතුරාජ වෙළ අසබඩ පිහිටි සුසාන භූමියේ ඒ සිරුර මිහදන් කරන ලදී.